# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,482 — 1965 අගෝස්තු 14 වැනි සෙනසුරාදා — 1965.8.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

### අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1965 අංක 305**

අ.ආ.කා. අංකය සී. 270/65 (2)

ප්‍රවාහණ ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු එඩ්වින් ලොකු බණ්ඩාර හුරුල්ලේ මහතා දිවයිනට ආපසු පැමිණෙන තුරු, අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 49 වැනි වගන්තිය යටතේ, ගරු ප්‍රවාහණ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, දසනායක මුදියන්සෙලාගේ ලොකු බණ්ඩා දසනායක මහතා, 1965 අගෝස්තු 10 වැනි දින සිට, ප්‍රවාහණ ඇමති වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 අගෝස්තු 10 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදී.

8–497

---

### ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.–බී 36/57

**1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත**

**33 වන වගන්තිය යටතේ ආඥාව**

1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතෙහි 33 වන වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමති, දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ පනවනු ලැබ, 1964 ඔක්තෝබර් 1 වන දින අංක 14,186 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නීතිගත කිරීමේ ආඥාවෙන් පිහිටුවන ලද ලංකා ධීවර නීතිගත සංස්ථාවේ කාර්‍යයන් සඳහා මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම අත්කර ගැනීමේ යෝජනාව මේ ආඥාවෙන් අනුමත කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමති.

1965.8.12 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ ගාලු මහා නගරයේ හා කඩවත් සතරේ ප්‍රදේශීය ආදායම් නිලධරයාගේ කොට්ඨාශයේ මාගල්ල ග්‍රාම සේවක කොට්ඨාශයේ මාගල්ල ග්‍රාමයේ පිහිටා ඇති මාතර පාරේ වරිපනම් අංක 216, 218, 220, 222, 230, 234, 236, 238, 240, 244, 244/1, 248, 250, 252, 254, 256, 258, 260, 264, 266, 268/1, 268/2, 270/1, 274, 276, 278, 282/2, 282, 284 හා 286 දරන (පාරවල් හා පාරවල්වලට වෙන් කරන ලද ඉඩම් ඇතුළුව) අක්කර හයකුත් රූඩ් එකකුත් පාර්චස් නමයක් (අ. 6, රූ. 1, ප.09) පමණ වූ භූමි භාගයක් ඇත්තා වූද, පහත සඳහන් මායිම් සහිත වූ ද යාබද බිම් කැබෙලි විසිහතරක් හා ඊට අයත් ගොඩනැගිලි :—

උතුරට : ... මාතර පාරද ;
නැගෙනහිරට : ... මරක්කල පල්ලියද;
දකුණට : ... මුහුදු වෙරළ ; හා
බස්නාහිරට : ... වරිපනම් අංක 214 දරන ස්ථානය හා සීයෝනීස්ගේ වත්ත.

8–601

1221——ආර් 8065—6,875 (65/8)

# මිල පාලන දැන්වීම්

**අංක ඇම්ටී/5/65 දරන ආහාර මිල ආඥව** | **අතිරේක ආහාර ද්‍රව්‍ය—මසූර් පරිප්පු**

## මිල පාලන පනත

### ආඥව

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මාතර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක තැන්පත් ලියනගේ දොන් තෝමස් ජයසිංහ වන මම, මේ ආඥවෙන්—

(i) 1963 ඔක්තෝම්බර් මස 15 වන දින අංක 13,792 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ 1963 ඔක්තෝම්බර් මස 10 වන දින අංක ඇම්ටී/12/63 දරන ආහාර මිල ආඥව, වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි ;

(ii) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දැක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දකු විසින් විකිණිය හැකි උපරිම තොග මිල ලෙස එවකට නියම කර ඇති මිල ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත ව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 සිට 7 වන තීරයන්හි නිශ්චිතව සඳහන් ප්‍රදේශ තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම තොග මිල විය යුතු ලෙස, වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි ;

(iii) මෙහි වූ උපලේඛනයේ 8 වන තීරයෙහි දැක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිල ලෙස එවකට නියමකර ඇති මිල, ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශ තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම සිල්ලර මිල විය යුතු ලෙස, වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි ;

(iv) මෙම ආඥවේ කාර්යය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්‍ය්‍යය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් ;

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩරයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්, නියම කරමි ;

(v) මෙම ආඥවෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සැම ප්‍රදේශයකම මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිම තැනැත්තකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි ;

(vi) මෙම ආඥවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සැම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සැම වෙළෙන්දකු විසින් ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍ය සඳහා මෙම ආඥවෙන් නියමිත උපරිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල සූචකයක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම කරන ලද උපරිම මිල යම් ගනුදෙනු කරුවකුට පැහැදිලිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළ යුතු බව නියම කරමි ;

(vii) මෙම ආඥවේ කාර්යය සඳහා "රාත්තල" හෝ "රා" යන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැලකිය යුතු බව නියම කරමි ;

(viii) මෙම ආඥවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සැම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සැම තැනැත්තකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සැම තැනැත්තෙකු විසින්ම ගැනුම්කරු ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය බර අනුව ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද, නැතහොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුලත් කුවිතාන්සියක් ගැනුම් කරුට දිය යුතු බව නියම කරමි ;

(ix) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණූ ලැබූ ද්‍රව්‍ය යම් දෙයක ඔතනු ලැබෙනම් නැතහොත් බහාලනු ලැබෙනම්, එහි මිළත් ඒ උපලේඛනයේ 2 වන සිට 8 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතු බව නියම කරමි.

1965 අගෝස්තු මස 10 වන දින උදේ 9.30 ට මාතර දී අත්සන් කරන ලදී.

ඇල්. ඩී. ටී. ජයසිංහ,
මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක.

### උපලෙඛනය

| 1 වන තීරය | 2 වන තීරය සීමාව | 3 වන තීරය සීමාව | 4 වන තීරය සීමාව | 5 වන තීරය සීමාව | 6 වන තීරය සීමාව | 7 වන තීරය සීමාව | 8 වන තීරය සීමාව |
|---|---|---|---|---|---|---|---|
| ද්‍රව්‍ය | මාතර නගර සභාව, දෙවිනුවර සුළු නගර සභාව, කැනඳූර ගම්සභාව, අපරැක්ක-බඹරැන්ද ගම්සභාව, මාලිම්බඩ ගම්සභාව, නායිමන-මාකවිට ගම්සභාව, තිහගොඩ ගම්සභාව, මඩිහ-ගොඩගම ගම් සභාව, ගන්දර ගම් සභාව, කෝට්ටගොඩ ගම්සභාව | වැලිගම නගර සභාව, වැලිගම ගම් සභාව, මිරිස්ස ගම් සභාව | අකුරැස්ස සුළු නගර සභාව, මාරඹ ගම් සභාව, කනංකෙ ගම් සභාව, ගොඩ පිටිය ගම් සභාව | හක්මන වලකඩගම් සභාව,කන්දපිට වලකඩ ගම් සභාව, කඹුරු පිටිය ගම්සභාව, කිරින්ද පුහුල් වැල්ල ගම්සභාව, දික්වැල්ල ගම් සභාව | මොරවක ගම්සභාව | බෙරල පනාතර ගම් සභාව, දෙනියාය ගම්සභාව | සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි, අධිකය |
| **තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය** | | | | | | | |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| මසූර් පරිප්පු—පිටරට පාහින ලද (1 වෙනි වර්ගය) ... | 3 10 ... | 3 0 ... | 3 0 ... | 3 20 ... | 3 30 ... | 3 40 ... | 0 03 |
| මසූර් පරිප්පු—මෙරට පාහින ලද (2 වෙනි වර්ගය) ... | 3 10 ... | 3 0 ... | 3 0 ... | 3 20 ... | 3 30 ... | 3 40 ... | 0 03 |

සැලකිය යුතුය.—මේ මිල ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියමකර ඇති මිල නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිල වන අතර ඊට ඉහළින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

8–575

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය අංක 61/9/194

ආදයම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1965 අගෝස්තු මස 16 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 04 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 06 |

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 781.
1965 අගෝස්තු මස 14 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දිය.

8–577

---

## රේගු දැන්වීම අංක 64/5/54

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 අගෝස්තු මස 16 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 215 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 286 43 ... | 278 57 ... | 236 57 ... | 71 61 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 744/22.
1965 අගෝස්තු මස 14 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දිය.

8–578

---

## රේගු ආඥාපනත

### නිවේදනය

(තලෙයිමන්නාරමෙන් හෝ තැපැලෙන් බඩු ගෙන්වන්නකු හැර) මෙරටට බඩු ගෙන්වන සෑම තැනැත්තකු විසින් ම, තීරු ගාස්තු ගෙවීම හෝ බැඳි ගුදමක තැන්පත් කිරීම සඳහා හෝ ගුදමකින් බඩු ඉවත් කර ගන්නා විට තීරු ගාස්තු ගෙවීම සඳහා, හෝ ඒ බඩු තීරු ගාස්තුවෙන් නිදහස් වූ විටක වුව ද ඒ බඩු සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙල කරනලද, පැහැයෙන් සුදු වූ ද ප්‍රමාණයෙන් අඟල් 20 ක් දික් වූ ද අඟල් 12 ක් පළල් වූ ද සටහන්කරයක් ප්‍රධාන රේගු අයකැමි වෙත 1965 සැප්තැම්බර් 1 වන දින සිට ඉදිරිපත් කළ යුතු බව (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී.පී. විට්ටාච්චි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1965 අගෝස්තු මස 14 වෙනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

ආනයනකරුගේ නම සහ ලිපිනය :————.

නෞකාවේ/යාත්‍රාවේ නම සහ දිනය ;————. සිට පැමිණි, කප්පිත්තා :————. සටහන්කර අංකය :————.

| 1 | 2 | 3 | | | 4 | 5 | 6 | 7 | 8 | 9 | | 10 | 11 | 12 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සලකුණු හා අංක | බඩු විස්තරය | වෙළඳ වර්ග කිරීම | | | ශුද්ධ බර | ප්‍රමාණය | ඉන්-වොයිස් වටිනාකම | විනිමය අනුපාතය | තීරුව සඳහා වටිනාකම | තීරු අනුපාතය | | තීරුව | ආදායම් විෂය | ප්‍රථම කුළී සහ වරාය ගාස්තු | | |
| | | වර්ගය | අංකය | උප අංකය | | | | | | වරණීය | සාමාන්‍ය | | | මානක හෝ වෙනත් විස්තර | විස්තර දක්වෙන්නේ පැටවුම් කරයෙන්ද ඉන්වොයිසියෙන්ද ගො. නි. ගේ. සටහනේද යන බව, ගණන සහ අනුපාතය | මුදල |
| | | | | | | | | | රු. සත | | | රු. සත | * | | | රු. සත |

මේ සටහන්කරයෙහි සඳහන් වන භාණ්ඩයන්ගේ ආනයනකරු මා බවත් එකී භාණ්ඩයන් ඒවා ඉදිරියේ දක්වා ඇති ඒ ඒ ගණන් හෝ වටිනාකම් අනුව ඇතුළත්කොට දක්වන බවත් මුළු මුදල රු.————සත————ක් (රු————සත————) වන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

මේ සටහන්කරය සනාථ කිරීම සඳහා පසු පසෙහි සැසඳුම් ලැයිස්තුවේ සඳහන් ලියකියවිලි සහ අධිකාරයන් මේ සමග ඉදිරිපත් කරමි.

19————දින මගේ අත්සන යොදන ලදී.

————————,
ආනයනකරුගේ හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාගේ අත්සන.

### එහා මෙහා යන පිළිවෙල

*(මේ කොටුව රේගු කාර්යයන් සඳහා හිස්ව තිබිය යුතුයි.)

| | දතම සහ වේලාව: එන | යන | අත් සන |
|---|---|---|---|
| 1. භාර ගැනීම ... | | | |
| 2. පත්කිරීම ... | | | |
| 3. තක්සේරුව ... | | | |
| 4. තීරු හා ගාස්තු ලිපිකරු ... | | | |

| | දතම සහ වේලාව: එන | යන | අත් සන |
|---|---|---|---|
| 5. සහකාර අයකැමි | | | |
| 6. සරප්/රික්විෂිෂන්/ලිපිකරු ... | | | |
| 7. මුදල් පොත ... | | | |
| 8. නැවබඩු ලැයිස්තුව ... | | | |

| දිගු කාමරය | සරප් හෝ රික්විෂිෂන් ලිපිකරු | | විනිමය පාලක මුද්‍රාව |
|---|---|---|---|
| මුදල් ගෙවීමටහා අනතුරුව බඩු ඉවත් කර ගැනීම සඳහා අනුමතයි | මුදල ———<br>කුවිතාන්සි අංකය——— | මුදල ——— | |
| ..................<br>ස.රේ./අය. | ..................<br>අත්සන හා දතම | ..................<br>අත්සන හා දතම | ..................<br>විනිමය පාලක නිලධාරි |

### සැසඳුම් ලැයිස්තුව

(සම්පූර්ණ කර ඇති විෂයයන් √ සලකුණින් ලකුණු කරන්න)

1. බඩුවල අයිතිය ප්‍රකාශ කිරීමේ ලියකියවිලි අමුණා ඇත ... ... ... ☐
2. ආනයන පාලක බලපත්‍රය භර කර ඇත ... ... ... ☐
3. නිපන් රටේ සහතිකය අමුණා ඇත (වරණීය අනුපාතය සඳහා) ... ... ☐
4. ඉන්වොයිසය සහ ඇහුරුම් ලැයිස්තුව අමුණා ඇත ... ... ... ☐
5. කාර්මික නිෂ්පාදන බලපත්‍රය අමුණා ඇත (කා. නි. ප. යටතේ නම්) ... ... ☐
6. රාජකාරි සටහන/ඉල්ලා සිටින තීරු බදු සහනයන් සනාථ කිරීමේ ලියකියවිලි... ... ☐

————————,
ආනයනකරුගේ අත්සන.

8–616

ලංකාවේ වාලච්චේනායෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි